## 11.1. දේශීය වෙළෙඳාම

154. ස්වයංපෝෂිත ක්‍රමය බිඳ වැටීමත් සමග භාණ්ඩ හුවමාරුව ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳාම බිහි විය. වෙළෙඳාමේ ගුණාංග කිහිපයක් පහත දැක්වේ.

A - ගැනුම්කරුවන් සිටීම

B - මුදල් පැවතීම

C - වටිනාකමක් සහිත දෙයක් දෙපාර්ශ්වයක් අතර හුවමාරු වීම

D - විකුණුම්කරුවන් සිටීම

E - භෞතික වෙළෙඳ පොළක් පැවතීම අනිවාර්ය වීම

F - ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් අතර එකඟතාවක් පැවතීම

වෙළෙඳාමක් ඇති වීම සඳහා මෙම ගුණාංග අතරෙන් කුමන ඒවා එක විට පැවතිය යුතු ද?

(1) A, C, D, E
(2) A, B, C, F
(3) A, B, D, F
(4) A, C, D, F
(5) A, B, D, E

(.........)

155. සිරිමල් කලිසම් 06 ක් සුමනසිරිගෙන් මිලට ගෙන අවුරුදු සමයේ අමල්ට හා කමල්ට කලිසම් 3 බැගින් විකුණන ලදී. මේ අනුව මෙහි පිළිවෙළින් තොග වෙළෙන්දා හා සිල්ලර වෙළෙන්දා වන්නේ,

(1) සිරිමල් හා කමල් ය.
(2) සුමනසිරි හා කමල්ය.
(3) අමල් හා කමල්ය.
(4) සුමනසිරි හා සිරිමල්ය.
(5) සිරිමල් හා අමල් ය.

(.........)

156. අමාලි හා තමාලි යෙහෙළියන් දෙදෙනෙකි. ඔවුන් දෙදෙනා ම අඹ ගෙඩි 100ක් බැගින් පලතුරු වෙළෙඳ සැලකින් මිලට ගත් අතර අමාලි අඹ මිලට ගත්තේ දානමය පිංකමක් සඳහා වන අතර තමාලි සිය පලතුරු බීමහලට ඒවා මිලට ගත්තාය. මේ අනුව අමාලි හා තමාලි යන දෙදෙනා සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර වන්නේ,

(1) අමාලි හා තමාලි යන දෙදෙනාම පාරිභෝගිකයෝය.
(2) අමාලි පාරිභෝගිකයෙකි. තමාලි සිල්ලර වෙළෙන්දෙකි.
(3) අමාලි සිල්ලර වෙළෙන්දෙකි. තමාලි පාරිභෝගිකයෙකි.
(4) අමාලි හා තමාලි යන දෙදෙනාම සිල්ලර වෙළෙන්දන්ය.
(5) අමාලි හා තමාලි යන දෙදෙනාම වෙළෙඳ නියෝජිතයෝය.

(.........)

National Institute of Education

157. X තීරුවේ නියෝජිතයන් වර්ග දැක්වෙන අතර Y තීරුවේ ඔවුන්ගේ මූලික ලක්ෂණ දැක්වේ.


| X | Y |
|---|---|
| 1. කොමිස් නියෝජිතයා | A - ගැනුම්කරු හා විකුනුම්කරු සම්මුඛ කරමින් වෙළෙඳාමට මග පාදයි. |
| 2. වෙන්දේසිකරු | B - ණයගැති මුදල් වෙනුවෙන් කැපවෙන නියෝජිතයා. |
| 3. බ්‍රෝකර් | C - ප්‍රධානියා වෙනුවෙන් තම පෞද්ගලික නමින් ගනුදෙනු කෙරේ. |
| 4. කැපකරු නියෝජිතයා | D - ප්‍රධානියාට වාසිදායක වන ලෙස ද තම අභිමතය පරිදි කටයුතු කරමින් කොමිස් මුදලක් ලබයි. |
| 5. සාධ්‍යකයා | E - විවෘතව හා වාචිකව මිල ගණන් හඬ නගා භාණ්ඩ අලෙවි කරයි. |

X තීරුව හා Y තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුරු කාණ්ඩය දක්වෙන වරණය තෝරන්න.

(1) 1 D, 2 E, 3 A, 4 B, 5 C
(2) 1 A, 2 C, 3 B, 4 D, 5 E
(3) 1 C, 2 B, 3 E, 4 A, 5 D
(4) 1 E,2 D, 3 C, 4 A, 5 B
(5) 1 B, 2 A, 3 D, 4 C,5 E

(………)

158. පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීමේ මාර්ග දෙකකට අදාළ තොරතුරු පහත දැක්වේ.




ඉහත දැක්වෙන බෙදාහැරීමේ මාර්ග හා සම්බන්ධ හිස්තැන්වලට අදාළ පාර්ශ්ව නිවැරදිව දැක්වෙන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

| | A | B | C | D |
|---|---|---|---|---|
| (1) | නියෝජිතයා | තොග වෙළෙන්දා | පාරිභෝගිකයා | සිල්ලර වෙළෙන්දා |
| (2) | තොග වෙළෙන්දා | පාරිභෝගිකයා | නියෝජිතයා | තොග වෙළෙන්දා |
| (3) | තොග වෙළෙන්දා | පාරිභෝගිකයා | නියෝජිතයා | සිල්ලර වෙළෙන්දා |
| (4) | තොග වෙළෙන්දා | නියෝජිතයා | පාරිභෝගිකයා | නිෂ්පාදකයා |
| (5) | නියෝජිතයා | පාරිභෝගිකයා | තොග වෙළෙන්දා | නිෂ්පාදකයා |

(………)

National Institute of Education

159. නිෂ්පාදිත බෙදාහැරීම් ක්‍රියාවලියේ දී නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර සිටින ඒ හා සම්බන්ධ විවිධ පාර්ශ්ව පොදුවේ හඳුන්වනු ලබන්නේ,

(1) අතරමැදියන් ලෙස ය. (2) නියෝජිතයන් ලෙසය.
(3) තොග වෙළෙඳුන් ලෙස ය. (4) සිල්ලර වෙළෙඳුන් ලෙස ය.
(5) සැපයුම්කරුවන් ලෙස ය.

(………)

160. වෙළෙඳාම හා සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

A - භාණ්ඩ තොග වශයෙන් ගබඩා කර තැබීම.
B - නැවත විකිණීමේ අරමුණින් භාණ්ඩ මිල දී ගැනීම.
C - අවසාන පාරිභෝගිකයාට භාණ්ඩ අලෙවි කිරීම.
D - වෙළෙඳ වට්ටම් ලබා දීම.
E - පාරිභෝගිකයාට භාණ්ඩ ණයට ලබා දීම.
F - භාණ්ඩ තොග වශයෙන් අලෙවි කිරීම.
G - භාණ්ඩ පරිහරණය කරන ආකාරය පැහැදිලි කර දීම.

ඉහත තොරතුරු ඇසුරින් තොග වෙළෙඳා හා සම්බන්ධ ලක්ෂණ පමණක් ඇතුළත් වන නිවැරදි පිළිතුරු කාණ්ඩය කුමක්ද?

(1) A,C, D, E (2) B, C, D, F
(3) C, D, F, G (4) A,C,F, E
(5) A,B,D, F

(………)

161. "ජානක ව්‍යාපාරිකයෝ"මිලි ලීටර් 400 ප්‍රමාණයේ සිසිල් බීම බෝතල් නිපදවා බෝතලයක උපරිම සිල්ලර මිල රු. 30ක් ලෙස ලකුණු කර අලෙවි කිරීමේ දී 20%ක් අඩු කරනු ලැබේ. ප්‍රදේශයේ ආගමික උත්සවයක් සංවිධානය කරන සුරනිමල ආගමික උත්සවයට සහභාගිවන්නන්ගේ ප්‍රයෝජනය සඳහා සිසිල් බීම බෝතල් 500ක් මිල දී ගනු ලැබීය.

"ජානක ව්‍යාපාරිකයෝ" විසින් සුරනිමලට භාණ්ඩ විකිණීම පෙන්වා දිය හැක්කේ,

(1) තොග වෙළෙඳාමක් ලෙස ය. (2) සිල්ලර වෙළෙඳාම ලෙස ය.
(3) පෞද්ගලික අලෙවිය ලෙස ය. (4) නියෝජිත වෙළෙඳාම ලෙස ය.
(5) අන්තරාල වෙළෙඳාම ලෙස ය.

(………)

162. "සුපිරි වෙළෙඳසල් ක්‍රමය තුළ දක්නට ලැබෙන මූලික ලක්ෂණයක් වන්නේ පහත ඒවායින් කුමක්ද?"

(1) තමන්ට අවශ්‍ය භාණ්ඩ තෝරා ගැනීමට පවතින නිදහස සීමා කර තිබීම.
(2) ස්වයං සේවා ක්‍රමයට භාණ්ඩ තෝරා ගෙන ගෙවීම් සිදු කර අත්පත් කර ගැනීමට හැකිවීම.
(3) කිසියම් සන්නම් නාමයක් යටතේ පවතින භාණ්ඩ ඒකක පමණක් විකිණීම සිදු කිරීම.
(4) අලෙවි ප්‍රවර්ධන කටයුතු සිදු නොකිරීම.
(5) ඍජු විකිණීම මඟින් අලෙවිය වර්ධනය කර ගැනීම.

(………)

163. සිල්ලර වෙළෙඳාමේ නව ප්‍රවණතාවක් ලෙස සැලකිය හැකි කරුණක් **නොවන්නේ**,

(1) නව තාක්ෂණය භාවිත කරමින් සිල්ලර වෙළෙඳසල් ක්‍රියාත්මකවීම යි.
(2) සිල්ලර වෙළෙඳ ව්‍යාපාර ලියාපදිංචි කර පවත්වාගෙන යාම යි.
(3) සිල්ලර වෙළෙඳ ව්‍යාපාර සංස්ථාපිත පොදු සමාගම් ලෙස පවත්වා ගෙන යාම යි.
(4) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනාවලට අනුව විවිධ වර්ගයේ නිෂ්පාදිත සැපයීම යි.
(5) පාරිභෝගික රුචි අරුචිකම් පිළිබඳ තොරතුරු නිෂ්පාදකයාට ලබා දීම යි.

(………)

164. ජානක නිපදවන ළමා ඇඳුම්මලීෂා වෙළෙඳ ආයතනයට අලෙවි කරන අතර තමප්‍රදේශයේ ගනුදෙනුකරුවන්ට ලබා දීම සඳහා මලීෂා විසින් ළමා ඇඳුම් මිල දී ගැනීම සිදු කරන්නේ ලකුණු කළ මිලට වඩා 10%ක් අඩුවෙනි.

මෙම සිද්ධියට අනුව මලීෂා වෙළෙඳ ආයතනයට සිදු කරන ළමා ඇඳුම් වෙළෙඳාම,

(1) ඍජු වෙළෙඳාමකි.
(2) තොග වෙළෙඳාමකි.
(3) සිල්ලර වෙළෙඳාමකි.
(4) අතරමැදි වෙළෙඳාමකි.
(5) නියෝජිත වෙළෙඳාමකි.

(………)

165. තොග වෙළෙන්දාගෙන් නිෂ්පාදකයාට ඉටුවන සේවාවක් නොවන්නේ,


(1) නිෂ්පාදකයාගේ නිෂ්පාදිත තොග වශයෙන් ලබා ගන්නා නිසා නිෂ්පාදකයාගේ ගබඩා පහසුකම් අවශ්‍යතාව අවම කර ගත හැකිවීම.
(2) වෙළෙඳපොළ පිළිබඳව පාරිභෝගික රුචි අරුචිකම් ආදිය නිෂ්පාදකයාට ලබා දීම.
(3) නිෂ්පාදකයාට අවශ්‍ය කෙරෙන මූල්‍ය පහසුකම් තොග වෙළෙන්දාගෙන් ලැබීම.
(4) නිෂ්පාදිත පාරිභෝගිකයා වෙත බෙදාහැරීමට නිෂ්පාදකයාට උපදෙස් ලැබීම.
(5) සිය නිෂ්පාදනයට අවශ්‍ය සේවා සියල්ල තොග වෙළෙන්දා නිෂ්පාදකයාට සැපයීම.

(………)



National Institute of Education

166. පහත සඳහන් ගැලීම් සටහනෙන් වෙළෙඳාමේ ප්‍රභේද පෙන්වයි.




ඉහත ගැලීම් සටහන මඟින් දක්වා ඇති A,B,C හා D යන අක්ෂරවලින් දැක්වෙන කොටස් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1) ආනයන වෙළෙඳාම, සිල්ලර වෙළෙඳාම/ තොග වෙළෙඳාම, අපනයන වෙළෙඳාම
(2) අපනයන වෙළෙඳාම, තොග වෙළෙඳාම/සිල්ලර වෙළෙඳාම, ආනයන වෙළෙඳාම
(3) සිල්ලර වෙළෙඳාම,තොග වෙළෙඳාම/ ආනයන වෙළෙඳාම, නියෝජිත වෙළෙඳාම
(4) තොග වෙළෙඳාම,සිල්ලර වෙළෙඳාම/ අපනයන වෙළෙඳාම, ආනයන වෙළෙඳාම
(5) තොග වෙළෙඳාම, සිල්ලර වෙළෙඳාම/ ප්‍රති අපනයන වෙළෙඳාම, අන්තරාල වෙළෙඳාම

(………)

## 11.2. විදේශ වෙළෙඳාම

167. මයුර විදේශ රටවල් කිහිපයකින්ම සිමෙන්ති මෙරටට ගෙන්වීම කළ ද ඉන් ඇතැම් ද්‍රව්‍ය රට තුළට නොගෙන වරාය තුළ දීම නැවත සැකසීමෙන් විදේශයන්ට අපනයනය කරයි. මයුර සම්බන්ධ වූ වෙළෙඳාම් ක්‍රමය හඳුන්වන්නේ,

(1) ආනයන වෙළෙඳාම ලෙස ය.
(2) අන්තරාල වෙළෙඳාම ලෙස ය.
(3) ප්‍රති අපනයන වෙළෙඳාම ලෙස ය.
(4) අපනයන වෙළෙඳාම ලෙස ය.
(5) විදේශ වෙළෙඳාම ලෙස ය.

(………)

168. දේශාන් විදේශ වෙළෙඳ පොළ හා සම්බන්ධව කටයුතු කරන ව්‍යාපාරිකයෙකි. ඔහු කලෙක සිට විදේශ රටවලින් ගෙන්වන ලද ඇඟළුම් රට තුළට ගෙනවිත් ඇතැම් ඒවා නැවත සකසා අපනයනය කරනු ලබයි. දේශාන් නිරතව සිටින වෙළෙඳාම් ක්‍රමය හඳුන්වන නිවැරදි පිළිතුර වන්නේ,

(1) ආනයන වෙළෙඳාම ලෙස ය.
(2) අන්තරාල වෙළෙඳාම ලෙස ය.
(3) ප්‍රති අපනයන වෙළෙඳාම ලෙස ය.
(4) අපනයන වෙළෙඳාම ලෙස ය.
(5) තොග වෙළෙඳාම ලෙස ය.

(………)

National Institute of Education

169. රටක් අපනයනය කරන භාණ්ඩ අදාළ රටේම නිපද වූ බවට සහතික කරමින් ඒවාට අපනයනය කරන රටේ පිළිගත් වෙළෙඳ අධිකාරියක්විසින් නිකුත් කරන ලියවිල්ල වන්නේ,

(1) අපනයන බලපත්‍රය යි.
(2) සනීපාරක්ෂක සහතිකය යි.
(3) ප්‍රභවස්ථාන සහතිකය යි.
(4) තානාපති ඉන්වොයිසිය යි.
(5) නෞභාර පත්‍රය යි.

(………)

170. ජාත්‍යන්තර වෙළෙඳාමේ නිරතවීමේ දී ඇතැම් ජගත් සංවිධානවලට සම්බන්ධ රටවල් හෝ ගිවිසුම්වලට බැඳී ඇති රටවල් අතර සිදු කෙරෙන වෙළෙඳාමේ දී ලැබෙන සහනදායී බදු ක්‍රමය වන්නේ,

(1) ආනයන තීරු බදු ය.
(2) අපයනය තීරු බදුය.
(3) පිරිවැටුම් බදුය.
(4) නිෂ්පාදන බදු ය.
(5) වරණීය තීරු බදුය.
(5) වරණීය තීරු බදුය.

(………)

171. විදේශ වෙළෙඳම මඟින් රටකට අත්පත් කරගත හැකි ප්‍රතිලාභක් නොවන්නේ,

(1) අතිරික්ත නිෂාපාදන අපනයනය කළ හැකි වීම
(2) නව තාක්ෂණික හා කළමනාකරණ නිපුණතා වර්ධනය වීම
(3) ආර්ථික වර්ධනය හා සංවර්ධනය ඇති කිරීම
(4) රටේ නිෂ්පාදනය කළ නොහැකි නිෂ්පාදිත පරිභෝජනයට ගත හැකි වීම
(5) දේශීය ළදරු කර්මාන්ත වර්ධනය වීම

(………)

172. විදේශ වෙළඳාමට සම්බන්ධ ව්‍යාපාරිකයන් ආනයනය කිරීමේ දී රජයට ගෙවූ බදු නැවත බදු ප්‍රතිදානයක් ලෙස ආපසු ලබා ගත හැකියි. මෙම සහනය හිමි වන වෙළෙඳාම් ක්‍රමය සලකුණු කරන්න.

(1) අන්තරාල වෙළෙඳාම
(2) අපනයන වෙළෙඳාම
(3) අන්තර් ජාතික වෙළෙඳාම
(4) ආනයන වෙළඳාම
(5) ප්‍රති අපනයන වෙළෙඳාම

(………)

National Institute of Education

173. සාමාජික රටවල කෙටිකාලීන ගෙවුම් ශේෂ හිඟයක් පියවා ගැනීම සඳහා ණය සපයන ජාත්‍යන්තර ආයතනය වන්නේ,

(1) ලෝක බැංකුව යි.
(2) ලෝක වෙළෙඳ සංවිධානය යි.
(3) ආසියානු සංවර්ධන බැංකුව යි.
(4) සාර්ක් සංවිධානය යි.
(5) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යි.

(………)

174. අපනයන වෙළෙඳාමේ දී නැවට භාණ්ඩ පටවන අවස්ථාවේ දී භාණ්ඩ නියමිත හා හොඳ තත්ත්වයෙන් ඇති බව සඳහන් කරමින් නිකුත් කරන ලියවිල්ල වන්නේ,

(1) පාරිශුද්ධ නෞභාර පත්‍රය
(2) මෙට් රිසිට් පත්‍රය
(3) සනීපාරක්ෂක සහතිකය
(4) අපනයන බලපත්‍රය
(5) අපනයන සටහන්කරය

(………)

175. අපනයනකරු අපනයනය කිරීමට අපේක්ෂා කරන භාණ්ඩ තොගය පිළිබඳව විස්තර ඇතුළත් කර අපනයනකරු විසින් අපනයන රටේ රේගුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ල

(1) අපනයන සටහන්කරයයි.
(2) ඉන්වොයිසියයි.
(3) නෞභාර පත්‍රයයි.
(4) අපනයන බලපත්‍රයයි.
(5) ඉන්ඩෙන්ටුවයි.

(………)

176. ඉන්දියානු රාජ්‍ය බැංකුවේ ගිණුමක් හිමි ඉන්දියන් මෝටර්ස් සමාගමෙන් ලංකා බැංකුවේ ගිණුමක් ඇති ජයවීර නැමැත්තා මෝටර් රථයක් ආනයනය කිරීමට තීරණය කර ඇත. මෙහි දී ණයවර ලිපිය නිකුත් කරනු ලබන්නේ,

(1) ජයවීර විසින් ඉන්දියන් මෝටර්ස් සමාගම වෙතයි.
(2) ජයවීර විසින් ලංකා බැංකු වෙතයි.
(3) ඉන්දියන් මෝටර්ස් සමාගම විසින් ජයවීර වෙතයි.
(4) ඉන්දියානු මෝටර් සමාගම විසින් ලංකා බැංකුව වෙතයි.
(5) ලංකා බැංකුව විසින් ඉන්දියානු රාජ්‍ය බැංකුව වෙතයි.

(………)

National Institute of Education

177. රටවල් අතර සිදුවන නිදහස් වෙළෙඳාමට බාධා ගෙන දෙන තීරු බදු**නොවන** බාධකයක් වන්නේ,

(1) වරණීය තීරු බදු අය කිරීම.

(2) ආනයන පංගු කිරීම.

(3) අපනයන පංගු කිරීම.

(4) අපනයන ආනයන තහනම් කිරීම.

(5) දැඩි විනිමය ප්‍රතිපත්ති අනුගමනය කිරීම.

(………)

178. භාණ්ඩ ආනයන ක්‍රියාපටිපාටියට අදාළ පියවර කිහිපයක් පහත දැක්වේ.

- ⋆ විදේශීය සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම
- ⋆ මිල විමසුමක් යැවීම
- ⋆ මිල කියුමක් ලැබීම
- ⋆ ආනයන බලපත්‍රයක් ලබාගැනීම
- ⋆ …………………………………….

ආනයන ක්‍රියාපටිපාටියට අනුව ඊළඟ පියවර වන්නේ,

(1) ඉන්ඩෙන්ටුව ලැබීම.

(2) විදේශ ගැනුම්කරුවන් සොයා ගැනීම.

(3) ඉන්ඩෙන්ටුව විදේශ අපනයනකරුවන්ට යැවීම.

(4) භාණ්ඩ නැව්ගත කර නෞභාර පත්‍රයක් ලබා ගැනීම.

(5) මිල කියුමක් යැවීම.

(………)

National Institute of Education

179. පහතX තීරුවෙන් වෙළෙඳ ගිවිසුම් හා සංවිධාන ද Yතීරුවෙන් ඊට අයත්වන රටවල් ද දැක්වේ.

| X | Y |
|---|---|
| 01. උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA) | A. බංගලාදේශය/ ඉන්දියාව/ මියන්මාරය/ ශ්‍රී ලංකාව/ භූතානය/ තායිලන්තය/ නේපාලය |
| 02. බිම්ස්ටෙක් (BIMSTEC) | B. ශ්‍රී ලංකාව/ පකිස්ථානය/ ඉන්දියාව/ නේපාලය/ මාල දිවයින/ බංගලාදේශය/ භූතානය/ ඇෆ්ගනිස්ථානය |
| 03. දකුණු ආසියානු වරණාත්මක වෙළෙඳ ගිවිසුම (SAPTA) | C. ඇමරිකා එක්සත් ජනපදය/ කැනඩාව/ මෙක්සිකෝව |
| 04. ආසියා පැසිපික් වෙළෙඳ ගිවිසුම (APTA) | D. පිලිපීනය/ මැලේසියාව/ තායිලන්තය/ ඉන්දුනීසියාව සිංගප්පූරුව/ වියට්නාමය/ ලාඕසය |
| 05. ආසියාන් සංවිධානය (ASEAN) | E. බංගලාදේශය/ චීනය/ ඉන්දියාව/ ලාඕසය/ මොංගෝලියාව/ ශ්‍රී ලංකාව/ දකුණු කොරියාව |

ඉහත X ටYතීරුව නිවරදිව ගැළපු විට පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1) A, C, B, E, D (2) C, B, A, D, E (3) B, A, C, D, E

(4) C, A, B, E, D (5) A, B, C, E, D

(………)

National Institute of Education

# ප්‍රශ්න සඳහා පිළිතුරු පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 5 | 46 | 3 | 91 | 2 | 136 | 2 | 181 | 4 |
| 2 | 1 | 47 | 2 | 92 | 4 | 137 | 2 | 182 | 1 |
| 3 | 3 | 48 | 3 | 93 | 1 | 138 | 3 | 183 | 4 |
| 4 | 3 | 49 | 4 | 94 | 1 | 139 | 5 | 184 | 2 |
| 5 | 2 | 50 | 3 | 95 | 5 | 140 | 5 | 185 | 2 |
| 6 | 3 | 51 | 5 | 96 | 1 | 141 | 3 | 186 | 2 |
| 7 | 3 | 52 | 5 | 97 | 3 | 142 | 3 | 187 | 3 |
| 8 | 4 | 53 | 3 | 98 | 3 | 143 | 2 | 188 | 5 |
| 9 | 3 | 54 | 1 | 99 | 4 | 144 | 2 | 189 | 1 |
| 10 | 4 | 55 | 5 | 100 | 3 | 145 | 4 | 190 | 5 |
| 11 | 2 | 56 | 2 | 101 | 1 | 146 | 3 | 191 | 4 |
| 12 | 1 | 57 | 4 | 102 | 2 | 147 | 2 | 192 | 3 |
| 13 | 3 | 58 | 3 | 103 | 1 | 148 | 2 | 193 | 3 |
| 14 | 1 | 59 | 1 | 104 | 5 | 149 | 5 | 194 | 3 |
| 15 | 3 | 60 | 1 | 105 | 2 | 150 | 4 | 195 | 2 |
| 16 | 1 | 61 | 1 | 106 | 5 | 151 | 1 | 196 | 5 |
| 17 | 3 | 62 | 2 | 107 | 4 | 152 | 4 | 197 | 1 |
| 18 | 5 | 63 | 2 | 108 | 2 | 153 | 3 | 198 | 1 |
| 19 | 2 | 64 | 4 | 109 | 2 | 154 | 4 | 199 | 1 |
| 20 | 3 | 65 | 3 | 110 | 2 | 155 | 4 | 200 | 4 |
| 21 | 4 | 66 | 2 | 111 | 2 | 156 | 2 | 201 | 1 |
| 22 | 1 | 67 | 3 | 112 | 3 | 157 | 1 | 202 | 5 |
| 23 | 5 | 68 | 5 | 113 | 4 | 158 | 2 | 203 | 5 |
| 24 | 4 | 69 | 2 | 114 | 2 | 159 | 1 | 204 | 4 |
| 25 | 4 | 70 | 1 | 115 | 1 | 160 | 5 | 205 | 5 |
| 26 | 4 | 71 | 2 | 116 | 1 | 161 | 2 | 206 | 1 |
| 27 | 5 | 72 | 5 | 117 | 4 | 162 | 2 | 207 | 5 |
| 28 | 2 | 73 | 5 | 118 | 5 | 163 | 3 | 208 | 2 |
| 29 | 4 | 74 | 4 | 119 | 4 | 164 | 2 | 209 | 2 |
| 30 | 1 | 75 | 3 | 120 | 2 | 165 | 5 | 210 | 4 |
| 31 | 2 | 76 | 1 | 121 | 3 | 166 | 4 | 211 | 5 |
| 32 | 1 | 77 | 4 | 122 | 1 | 167 | 2 | 212 | 2 |
| 33 | 3 | 78 | 3 | 123 | 5 | 168 | 3 | 213 | 3 |
| 34 | 1 | 79 | 4 | 124 | 5 | 169 | 3 | 214 | 5 |
| 35 | 1 | 80 | 3 | 125 | 2 | 170 | 5 | 215 | 2 |
| 36 | 4 | 81 | 4 | 126 | 4 | 171 | 5 | 216 | 5 |
| 37 | 4 | 82 | 2 | 127 | 2 | 172 | 5 | 217 | 3 |
| 38 | 1 | 83 | 3 | 128 | 3 | 173 | 5 | 218 | 2 |
| 39 | 1 | 84 | 3 | 129 | 4 | 174 | 1 | 219 | 4 |
| 40 | 3 | 85 | 2 | 130 | 3 | 175 | 1 | 220 | 5 |
| 41 | 2 | 86 | 4 | 131 | 2 | 176 | 5 | 221 | 2 |
| 42 | 3 | 87 | 3 | 132 | 3 | 177 | 1 | 222 | 4 |
| 43 | 2 | 88 | 2 | 133 | 4 | 178 | 3 | 223 | 3 |
| 44 | 2 | 89 | 4 | 134 | 4 | 179 | 4 | 224 | 2 |
| 45 | 1 | 90 | 5 | 135 | 5 | 180 | 5 | 225 | 4 |

National Institute of Education

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 226 | 1 | 251 | 4 | 276 | 3 | 301 | 2 | 326 | 1 |
| 227 | 5 | 252 | 4 | 277 | 2 | 302 | 5 | 327 | 1 |
| 228 | 2 | 253 | 1 | 278 | 3 | 303 | 4 | 328 | 2 |
| 229 | 5 | 254 | 5 | 279 | 5 | 304 | 3 | 329 | 4 |
| 230 | 5 | 255 | 3 | 280 | 2 | 305 | 3 | 330 | 1 |
| 231 | 2 | 256 | 5 | 281 | 4 | 306 | 2 | 331 | 3 |
| 232 | 1 | 257 | 5 | 282 | 3 | 307 | 3 | 332 | 1 |
| 233 | 2 | 258 | 4 | 283 | 4 | 308 | 5 | 333 | 4 |
| 234 | 5 | 259 | 5 | 284 | 4 | 309 | 3 | 334 | 1 |
| 235 | 2 | 260 | 3 | 285 | 2 | 310 | 3 | 335 | 3 |
| 236 | 3 | 261 | 4 | 286 | 4 | 311 | 5 | 336 | 2 |
| 237 | 4 | 262 | 3 | 287 | 3 | 312 | 3 | 337 | 5 |
| 238 | 4 | 263 | 2 | 288 | 1 | 313 | 1 | 338 | 1 |
| 239 | 3 | 264 | 1 | 289 | 2 | 314 | 1 | 339 | 3 |
| 240 | 2 | 265 | 2 | 290 | 2 | 315 | 1 | 340 | 3 |
| 241 | 4 | 266 | 2 | 291 | 4 | 316 | 1 | 341 | 5 |
| 242 | 4 | 267 | 3 | 292 | 1 | 317 | 4 | 342 | 2 |
| 243 | 3 | 268 | 3 | 293 | 1 | 318 | 5 | 343 | 1 |
| 244 | 5 | 269 | 1 | 294 | 5 | 319 | 2 | 344 | 5 |
| 245 | 2 | 270 | 3 | 295 | 4 | 320 | 3 | 345 | 2 |
| 246 | 4 | 271 | 5 | 296 | 2 | 321 | 3 | 346 | 3 |
| 247 | 5 | 272 | 3 | 297 | 3 | 322 | 2 | 347 | 3 |
| 248 | 3 | 273 | 4 | 298 | 3 | 323 | 2 | 348 | 2 |
| 249 | 3 | 274 | 5 | 299 | 2 | 324 | 3 | 349 | 1 |
| 250 | 3 | 275 | 1 | 300 | 4 | 325 | 4 | 350 | 3 |

National Institute of Education

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."